සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

## පුරවැසි අධ්‍යාපනය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- 1- 5 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

01. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවක් ලෙස ........................................ දැක්විය හැකිය.
(අධ්‍යාපන සේවා, තැපැල් හා විදුලි පණිවිඩ සේවා, ජල සම්පාදන සේවා)

02. නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේ ............................ මැතිතුමාටය.
(සී. ඩබ්. ඩබ්. කන්නන්ගර, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, පොන්නම්බලම් රාමනාදන්)

03. සිසු සැරිය හා ..................................... යනු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් මහජනතාව වෙත සපයා ඇති විශේෂ සේවා වේ. (මඟ සැරිය, විදු සැරිය, ගැමි සැරිය)

04. .................................. යන්න සමුපකාරයේ ආදර්ශ පාඨය වේ.
(එකා සැමටත් සැම එකාටත්, විද්‍යා දදාති විනයන්, ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරී)

05. පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතනයක් ලෙස .................................. හැඳින්විය හැකිය.
(ශ්‍රී ලංකා පොලීසිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සමුපකාරය)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශය හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම, පවුලක් තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි (............)

07. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (යුනිසෙෆ්), ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයක් වේ. (............)

08. අයහපත් චිත්තවේග තත්ත්වයන්ට දිගින් දිගටම මුහුණ දීම නිසා පුද්ගලයා කායික, මානසික හා සාමාජීය වශයෙන් දියුණුවකට ලක්වේ. (............)

09. "තමා කැපී පෙනීමට උත්සාහ දැරීම" ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු ලක්ෂණයක් වේ. (............)

10. ප්‍රජාතන්ත්‍රවාදී රටක දේශපාලන නායකත්වය තෝරාගැනීමේ දී භාවිත කරන ක්‍රමවේදය වන්නේ මැතිවරණ පැවැත්වීමයි. (............)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුර හිස්තැන් මත ලියන්න.**

11. ........................................................ ආගමිකයන් විසින් වෙසක් හා පොසොන් උත්සව සමරනු ලබයි.

12. මස්ජිදය යනු ..................................................... ජන වර්ගයට අයත් ආගමික ස්ථානය වේ.

13. හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සවයක් ලෙස ............................................... හඳුන්වනු ලබයි.

14. ඕනෑම සමාජයක් මෙහෙයවන ප්‍රධානම බලවේගය වන්නේ .................................................... යි.

15. ...................................................................... විසින් තම රටේ රාජ්‍ය භාෂාව ලෙස හින්දි හා ඉංග්‍රීසි යන භාෂා දෙකම භාවිතා කරනු ලබයි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට** අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් **නොවන්නේ,**
    1. වනාන්තර විනාශ කිරීම
    2. වගුරුබිම් ගොඩකිරීම
    3. පතල් කැපීම
    4. දිරාපත් නොවන අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීම.

17. පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියක් නිසා ඇතිවන ස්වාභාවික විපතකි.
    1. ගංවතුර
    2. භූමි කම්පා
    3. නියඟ
    4. සුළි සුළං

18. නියඟයක් නිසා ඇතිවිය හැකි තත්ත්වයක් වන්නේ,
    1. පානීය ජල හිඟය
    2. භූගත ජල මට්ටම ඉහළ යාම
    3. වගා භූමි සරුවීම
    4. ජල විදුලිබල උත්පාදනය නිසිලෙස සිදුවීම.

19. සුනාමි තත්ත්වයක දී සිදුවන හානි අවම කරගැනීම සඳහා කළයුතු ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?
    1. කෙටි කලක් තුළදී විශාල රළ ඇතිවිය හැකි බැවින් මුහුදු දෙසට ගමන් කිරීම.
    2. අනතුරු ඇඟවීම් කර ඇති ප්‍රදේශවලින් ඉවත් නොවීම.
    3. සන්නිවේදන මාධ්‍ය මගින් ලබාදෙන අනාවැකි පිළිබඳ අවධානය යොමු කිරීම.
    4. සුනාමියක පෙරනිමිති පිළිබඳ දැනුවත් නොවීම.

20. "ආපදා ඇතිවීම සම්පූර්ණයෙන් ම නැවැත්විය නොහැකි වුවත් ආපදා මගින් ඇතිවන හා ඇතිවිය හැකි හානි අවම කර ගත හැකිය." මෙම ක්‍රියාවලිය හඳුන්වන නම වන්නේ,
    1. ආපදා කළමනාකරණය
    2. 3 R ක්‍රමය
    3. 5 S ක්‍රමය
    4. තිරසර සංවර්ධනය

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. A B C D




i. ඉහත රූප සටහන් හතරක් මගින් නිරූපනය වන අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවාවන් නම් කරන්න.

A ........................................ B ........................................

C ........................................ D ........................................

(ලකුණු 04)

ii. ඉහත C රූප සටහන මගින් පෙන්වන පොදු සේවාව සැපයීමට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සමිති වර්ග 4ක් දක්වන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

(ලකුණු 04)

iii. ඉහත D රූප සටහන මගින් නිරූපනය වන පොදු සේවාව මගින් මහජනයා වෙත සපයන සේවා 4ක් ලියන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

(ලකුණු 04)

iv. A රූප සටහන මගින් දක්වන පොදු සේවාව සපයන ආයතන මගින් මහජනතාව වෙත ඉටුකළ යුතුකම් 4ක් දක්වන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

(ලකුණු 04)

02. i. පොදු සේවා මහජනතාව වෙත සැපයිය යුත්තේ ඇයි? හේතු 2ක් දක්වන්න.

................................................................................

................................................................................

(ලකුණු 02)

ii. පොදු සේවා යන්න නිර්වචනය කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 03)

iii. පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව වර්ග කරන්න.

පොදු සේවා

| | | |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |

(ලකුණු 03)

iv. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඔබ ප්‍රදේශයට සපයන සේවා 2ක් සඳහන් කරන්න.

(ලකුණු 03)

03. i. පාසල තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 02)

ii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආයතන තුනක් නම් කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 03)

iii. ළමා අයිතිවාසිකම් හා යුතුකම් ඇතුළත් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
|---|---|
| 1. අධ්‍යාපනය ලැබීම. | 1. ........................................................................ |
| 2. නිසි රැකවරණය ලැබීම. | 2. ........................................................................ |
| 3. සෞඛ්‍ය පහසුකම් ලැබීම. | 3. ........................................................................ |

(ලකුණු 03)

iv. ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග 2ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 03)

04. i. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතුවිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 02)

ii. නායකයා හා අනුගාමිකයා ඇසුරින් හිස්තැන් පුරවන්න.

| නායකයා | අනුගාමිකයා |
|---|---|
| 1. විදුහල්පති | 1. ............................................................ |
| 2. ...................................... | 2. ඡන්ද දායකයින් |
| 3. ....................................... | 3. පවුලේ සෙසු සාමාජිකයින් |

(ලකුණු 03)

iii. ඔබේ සිතේ ඇතිවන චිත්තවේග වලට දක්වන ප්‍රතික්‍රියාව බැගින් ලියන්න.

| චිත්ත වේගය | ප්‍රතික්‍රියාව |
|---|---|
| 1. සතුට | 1 ........................................................................................................ |
| 2. දුක | 2. ....................................................................................................... |
| 3. කෝපය | 3. ........................................................................................................ |

(ලකුණු 03)

iv. අයහපත් චිත්තවේග සමනය කිරීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 3ක් සඳහන් කරන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 03)

05. i. සංස්කෘතිය යන්නට නිර්වචනයක් සපයන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 02)

ii. බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ 3ක් දක්වන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 03)

iii. පහත සංස්කෘතීන් වලට අදාල පුද්ගලයින් සමරන උත්සවය බැගින් ලියන්න. (ලකුණු 03)

| සංස්කෘතිය | උත්සවය |
|---|---|
| 1. බෞද්ධ සංස්කෘතිය | 1. ............................................................ |
| 2. ඉස්ලාම් සංස්කෘතිය | 2. ............................................................ |
| 3. ක්‍රිස්තියානි/කතෝලික සංස්කෘතිය | 3. ............................................................ |

06.




i. ඉහත පින්තූරයෙන් දැක්වෙන ස්වාභාවික විපත නම් කරන්න.

..........................................................................................................................................

(ලකුණු 02)

ii. ඉහත ඔබ සඳහන් කල ස්වාභාවික විපත ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 03)

iii. ආපදා හා අනතුරු අවස්ථා වලදී ඔබට සහය ලබාගත හැකි ආයතන 3ක් නම් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 03)

iv. මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතුවක් ලෙස රියදුරන් අතින් සිදුවන වැරදි හැඳින්විය හැක. මෙලෙස ඔවුන් අතින් සිදුවන වැරදි 3ක් සඳහන් කරන්න.


..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 03)

07. පහත උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ලකුණු 11)




පහලට

1. "ආපදා ඇතිවීම සම්පූණර්යෙන්ම නැවැත්විය නොහැකි වුවත් ආපදා මගින් ඇතිවන හානි අවම කරගත හැකිය" මෙම ක්‍රියාවලිය හඳුන්වන නම?
3. සිතේ ඇතිවන චිත්තවේගයකි.
6. ඉස්ලාම් භක්තිකයන් විසින් සමරණ උත්සවයකි.
8. ඉන්දියාවේ ජාතික භාෂා දෙකෙන්, එකකි.
11. ස්වාභාවික ආපදාවකි.

හරහට

2. සහනදායි අයකිරීමේ පදනම මත සපයන පොදු සේවාවකි.
3. ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ භූමිය ලෙස හැඳින්වේ.
5. අනතුරු ඇතිවිය හැකි ස්ථානයකි.
7. බහු සංස්කෘතික සමාජයක ආරක්ෂාකරගත යුතුම සාධකයකි.
9. ඇමරිකාව තුළ ජීවත් වන ජන වර්ගයකි.
10. ඕනෑම සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය වන්නේ මෙයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 08 - 2023

# පුරවැසි අධ්‍යාපනය

## පිළිතුරු පත්‍රය

### I කොටස

1. තැපැල් හා විදුලි පණිවිඩ සේවා 2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර 3. ගැමි සැරිය
4. "එකා සැමටත් සැම එකාටත්" 5. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. ✓ 7. ✓ 8. × 9. × 10. ✓ 11. බෞද්ධ 12. මුස්ලිම්
13. තෛපොංගල්/දීපවාලි/මහාශිව රාත්‍රි 14. සංස්කෘතිය 15. ඉන්දියාව
16. දිරාපත් නොවන අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීම. 17. භූමි කම්පා 18. පානීය ජල හිඟය
19. සන්නිවේදන මාධ්‍ය මගින් ලබාදෙන අනාවැකි පිළිබඳ අවධානය යොමු කිරීම. 20. ආපදා කළමනාකරණය

### II කොටස

1. i. A අධ්‍යාපන සේවා B පණිවිඩ හුවමාරුව C සමුපකාරය D ආරක්ෂක සේවා
 ii. 1. විවිධ සේවා සමූපකාර සමිතිය 2. ප්‍රවාහන සේවා සමූපකාර සමිතිය
 3. සමූපකාර ණයදෙන සමිතිය 4. රෝහල් සමූපකාර සමිතිය
 iii. 1. නීතිය හා සාමය ආරක්ෂා කිරීම 2. මහජන ආරක්ෂාව සැපයීම
 3. මාර්ග ආරක්ෂාව හා රථවාහන හැසිරවීම 4. අපරාධ පිළිබඳ විමර්ශනය
 iv. 1. නිසි පරිදි අධ්‍යාපනය ලබාදීම 2. නිපුණතා සංවර්ධනය කිරීම
 3. සමාජානුයෝගී කිරීම 4. සමාජයට වැඩදායි පුරවැසියන් බිහි කිරීම

2. i. 1. ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීම 2. ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීම.
 ii. "ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පොදුවේ සියලුම ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි වනසේ රජය හා පෞද්ගලික අංශය මගින් සපයන සේවා පොදු සේවා වේ."
 iii.
 - පොදු සේවා
 - නොමිලේ සපයන පොදු සේවා
 - සහනදායී අයකිරීමේ පදනම මත සපයන පොදු සේවා
 - මුදල් අයකර සපයන පොදු සේවා

 iv. 1. බෝවන රෝග මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. 2. ළදරු හා මාතෘ සායන පැවැත්වීම.
 3. ප්‍රතිශක්තීකරණ එන්නත් ලබාදීම.

3. i. 1. සාකච්ඡා මගින් නිවැරදි තීරණ වලට එළඹීම 2. සහයෝගයෙන් කටයුතු කිරීම
 ii. 1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2. පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරිය
 3. ළමා හා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලීසිය
 iii.

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
|---|---|
| 1. අධ්‍යාපනය ලැබීම. | 1. හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වීම. |
| 2. නිසි රැකවරණය ලැබීම. | 2. මවුපිය, වැඩිහිටියන්ට ගරුකිරීම හා අවනත වීම. |
| 3. සෞඛ්‍ය පහසුකම් ලැබීම. | 3. පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ දැනුවත් වීම. |

 iv. 1) අන් අයගේ මතයට ගරුකිරීම 2) සයෝගයෙන් වැඩ කිරීම.(මින් එකක් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

4. i. අවංක කම, කැපවීම, මිත්‍රශීලී බව, සමානාත්මතාව, මිත්‍රශීලී බව

ii.

| නායකයා | ළමා යුතුකම් |
|---|---|
| 1. විදුහල්පති | 1. ගුරු මණ්ඩලය සහ සිසු දරු දැරියන් |
| 2. මන්ත්‍රීවරයා | 2. ඡන්ද දායකයන් |
| 3. පියා | 3. පවුලේ සෙසු සාමාජිකයන් |

iii.

| චිත්තවේග | ප්‍රතික්‍රියාව |
|---|---|
| 1. සතුට | 1. සිනාසීම, නැටීම, කෑ ගැසීම |
| 2. දුක | 2. හැඬීම, සුසුම් හෙළීම, මුහුණ මලානික වීම |
| 3. කෝපය | 3. බැන වැදීම, පහර දීම, දත්මිටිකෑම |

iv. 1. ආගමික කටයුතු වල යෙදීම 2. මල් වැවීම 3. නිර්මාණ සඳහා යොමුවීම
4. ක්‍රීඩා කිරීම

5. i. මිනිසා විසින් අයත්කරගෙන ඇත්තාවූ දැනුම, විශ්වාස, කලා සිරිත් විරිත්, ජීවනෝපාය ආදී සියල්ල සංස්කෘතියයි.
ii. ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍ය
iii. 1. විවිධ ජන වර්ග ජීවත් වීම 2. විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම
3. විවිධ භාෂා කතාකරන ජන කොටස් ජීවත් වීම. 4. විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම.

iv.

| සංස්කෘතිය | උත්සවය |
|---|---|
| 1. බෞද්ධ සංස්කෘතිය | 1. වෙසක්, පොසොන්, ඇසළ |
| 2. ඉස්ලාම් සංස්කෘතිය | 2. රාමසාන්, හජ්ජි, මිලාදුන් නබි උත්සවය |
| 3. ක්‍රිස්තියාන/කතෝලික සංස්කෘතිය | 3. නත්තල්, පාස්කු |

6. i. ගංවතුර
ii. 1. වනාන්තර විනාශ කිරීම 2. වගුරු බිම් ගොඩකිරීම
3. පතල් කැනීම 4. ගංගාවලින් වැලි ගොඩදැමීම
iii. 1. රෝහල 2. පොලීසිය 3. ගිනි නිවන ඒකකය 4. ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය
iv. 1. බීමත්ව රිය පැදවීම 2. අධික වේගයෙන් රිය පැදවීම
3. රිය පදවන අතරතුර ජංගම දුරකතන භාවිතා කිරීම 4. වැඩිපුර මගීන් ගෙනයාම

7.

